# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 ඔක්තෝබර් මස 09 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.33 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**•පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරුද්ධ ලේකම්ගේ
අමල් සිල්වා
ඇන්ටනී උපුල් රාජිත
ඈ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
උදාර රත්නායක
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවර්දන්
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගුණසිරි ජයනාත්
ජගත් කුමාර
ජනක කුරුප්පු

ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්

යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රවීන්ද්‍ර යසස් කුමානායක
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් ජයමිණී
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අසෝක රන්වල
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඉන්දික බණ්ඩාර
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදේන විජේරත්න
එස්.එම්. සකාවුල්ලා
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය

කිත්සිරි මංචනායක
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්ද්‍රසෝම සරණලාල්
ජගත් අංගගේ
ජගත් පී. විතාන
නිරෝෂන් පාදුක්ක
ප්‍රදීප් පෙරේරා
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මංජුල බුද්ධදාස

රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලලිත් එල්ලාවල
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සුසාර දිනාල්
ශ්‍රීනාත් පෙරේරා

## 01. සභාපතිවරයාගේ නිවේදනය :

*i*

*"බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතෙහි පිහිටි නව පළාත් සභා කාර්යාල ගොඩනැගිල්ලෙහි සභා ලේකම් කාර්යාලය ස්ථාපිත කර 2018.10.01 දින පටන් ක්‍රියාත්මකව පවතින බව ගරු මන්ත්‍රීවරුන් වෙත කාරුණිකව දැනුම් දෙන බවත්, එතෙක් සෙත්සිරිපායෙහි ක්‍රියාත්මකව පැවැති සභා ලේකම් කාර්යාලයට අනුබද්ධ සියලුම කාර්යාල බත්තරමුල්ල නව ගොඩනැගිල්ලෙහි 11 වන මහලේ හා 12 වන මහලේ ස්ථාපිත කර ඇති බව වැඩිදුරටත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2019 වසරට අදාළ මුදල් ප්‍රකාශය හා 2019 වර්ෂයේ සංවර්ධන සැලසුම් පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා නේවාසික වැඩ මුළුවක් 2018 නොවැම්බර් මස 08, 09, 10 යන දිනයන්හිදී පැවැත්වීමට නියමිත බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. නොපැමිණ සිටීමේ අවසරය :

*"විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි හරිස්චන්ද්‍ර ද කොස්තා ගරු මන්ත්‍රීතුමා විසින් ද,*

*ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ද ඉදිරිපත් කරන ලද යෝජනාවන් සභා සම්මත විය."*

## 03. ලිපි ලේඛන පිළිගැන්වීම :

**අමාත්‍යාංශ උපදේශක කාරක සභා රැස්වීම් වාර්තා :**

*බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් 2018.08.24 වන දින පැවැත් වූ උපදේශක කාරක සභාවේ රැස්වීම් වාර්තාව ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් සභාවට පිළිගන්වන ලදී.*

**පරිපූරක ඇස්තමේන්තුව :**

*2018 පරිපූරක ඇස්තමේන්තුව 01 හා 02 යටතේ අනුමත ව්‍යාපෘතීන්හි ප්‍රගති වාර්තාවන් ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් සභාවට පිළිගන්වන ලදී.*

## 04. කාරක සභා වාර්තා :

2018.09.19 සහ 21 වන දිනවල පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තා ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.13 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 05. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"බස්නාහිර පළාතේ අධ්‍යාපන කලාප මට්ටමින් පිහිටුවනු ලැබ අතිවිශේෂ අවශ්‍යතා ඇති දරුවන් ඉගෙනුම ලබන පාසල් සංඛ්‍යාව 182 ක් පමණ වන අතර, එම පාසල්වල ඉගෙනුම ලබන විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සංඛ්‍යාව 3713 කි.*

*රජයේ පාසල්වල ඉගෙනුම ලබන සාමාන්‍ය දරුවන්හට 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ශිෂ්‍ය ආධාර මුදලක්ද, විශ්ව විද්‍යාල සිසුන් හට මහපොළ ශිෂ්‍යත්වය මගින් ශිෂ්‍ය ආධාර මුදලක්ද ලබා දීමේ ක්‍රමවේදයක් පැවතිය ද විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හට ශිෂ්‍ය ආධාර මුදලක් ලබා දීමේ ක්‍රමවේදයක් නොමැත.*

*බස්නාහිර පළාතේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අධ්‍යාපනය ලබා දෙන පාසල්වල ඉගෙනුම ලබන දරුවන් දිරි ගැන්වීම සඳහා එම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් යම් දීමනාවක්, ආධාර මුදලක් ලබා දිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කර සිටියි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ.භා. 12.18 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***අනතුරුව, ප්‍රශ්න විමසන ලදින්, සභා සම්මත විය.***

## 06. කල් තැබීමේ යෝජනාව :

සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ප්‍රශ්න සභාභිමුඛ කරන ලදී.***

### කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න :

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය.

අ. බස්නාහිර පළාත් ආණ්ඩුකාර තනතුර වෙනුවෙන් නිල නිවසක් ඉදි කරමින් තිබේද?

ආ. ඉදි කිරීම් සිදු වන්නේ කුමන ස්ථානයකද?

ඇ. ඇස්තමේන්තුගත මුළු මුදල කීයද?

ඈ. ඉදි කිරීම් සිදු කරන ආයතනය කවරේද?

ඉ. ගොඩනැගිල්ල තට්ටු කීයකින් සමන්විතද?

ඊ. අත්තිවාරම සඳහා කොපමණ මුදලක් වැය කළේද?

උ. අත්තිවාරම පයිල් (Pile) කිරීමට හේතු කවරේද?

***ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් එකී ප්‍රශ්න සඳහා පිළිතුරු දීමට සති 02 ක කාලයක් කල් ගන්නා ලදී.***

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය.

අ. බස්නාහිර පළාතේ දැනට ගුරු සේවයේ පුරප්පාඩු කීයක් තිබේද?

ආ. පත්වීම් නොලබා සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ පිරිස කොපමණද?

ඇ. 2014.08.08 ගැසට් නිවේදනය යටතේ පැවැත් වූ තරග විභාගයෙන් කීදෙනෙක් බඳවාගෙන තිබේද?

ඈ. 2007 හා 2011 ලකුණු 80 ලබාගත් සියලු දෙනාටම පත්වීම් ලබා දුන්නේ නම් 2014 විභාගය පවත්වා වසර 04 කට ආසන්න කාලයක් තුළ මෙම පත්වීම් ලබා නොදීමට හේතුව කුමක්ද?

ඉ. බස්නාහිර පළාත තුළ 3000 කට අධික ප්‍රමාණයක ගුරු හිඟයක් පවතීද?

ඊ. එම හිඟයට මෙම පත්වීම් ලබා දිය නොහැකිද? (සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අය)

උ. 2018.07.23 සිට 2018.07.31 දක්වා පැවැති සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අය සඳහා පත්වීම් ලබා දෙන්නේද?

ඌ. 2014.12.27 වන දින සම්මුඛ පරීක්ෂණය සඳහා මුහුණ දුන් උපාධිධාරීන් හට පත්වීම් ලබා දීමට කටයුතු සිදු කරන්නේද?

***ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා (ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන්) එකී ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා සති දෙකක් කල් ගන්නා ලදී.***

***අනතුරුව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සිරිකමල් පිලිෂියන් ද සිල්වා මහතා] විසින් සියලු ප්‍රශ්න ඊළඟ සභා දින න්‍යාය පත්‍රයට යොමු කරන ලදී.***

## 07. කල් තැබීම :

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා *[සිරිකමල් පිලිෂියන් ද සිල්වා මහතා]* විසින් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.23 ට, 2018 ඔක්තෝබර් මස 23 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.10.09
බස්නාහිර පළාතේ පළාත් සභාව,
11 වන මහල,
බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණය,
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
ශ්‍රී ජයවර්ධනපුර,
බත්තරමුල්ල.

පූඊ/09
Minuts 2018.10.09 - Hansard Sectionr